# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 මාර්තු මස 06 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.35 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩ් තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පංචරත්නම් රාම්
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුනිල් ජයමිණි
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අසෝක රන්වල
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
උදේන විජේරත්න
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් පී. විතාන
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
විජිත් ප්‍රියන්ත
සලෝචන ගමගේ
සුසාර දිනාල්

## 01. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

ගරු සභාපතිතුමා විසින් 2018.02.21 වැනි දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සභාවට පිළිගන්වන ලදී.

## 02. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I [2018.02.23 වන දින රැස්වීමේ කටයුතුවලට අදාළයි.]

2018.02.23 වන දින පළාත් සභා රැස්වීමේදී රීති අංක 107 යටතේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව යළිත් සභාභිමුඛ විය.

> *"කේවල හා සමානුපාතික අනුපාතය 60% ක් හා 40% ක් ලෙස වූ මිශ්‍ර ක්‍රමයක් වශයෙන් හඳුන්වා දුන් නව මැතිවරණ ක්‍රමයක් යටතේ ප්‍රථම වරට පැවති පළාත් පාලන මැතිවරණයෙහි ප්‍රතිඵලවලට අනුව, පළාත් පාලන ආයතන සඳහා බහු පක්ෂ ක්‍රමයක් තුළ නියෝජිතයන් පත්ව ඇති ආකාරය අනුව එම පළාත් පාලන ආයතනයන්හි ස්ථාවර පාලනයක් පිහිටුවීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. පළාත් පාලන මැතිවරණය සඳහා වන එම අනුපාතයන් මත, එවැනි දුෂ්කරතාවයන් මතු වීමෙන් හෙළිවන කරුණක් වනුයේ, ඉදිරියේ මෙම ක්‍රමය යටතේ පැවැත්වෙන පළාත් සභා මැතිවරණක දී, දැනට යෝජිත පරිදි කේවල හා සමානුපාතික අනුපාතය 50% ක් බැගින් වන සේ වුවහොත්, පළාත් සභාවන්හි පාලනය පිහිටිවීමේදී ද දැඩි අස්ථාවර තත්ත්වයකට මුහුණ දීමට සිදු විය හැකි බවය. එබැවින් පළාත් සභා මැතිවරණ ක්‍රමය සකස් කිරීමේදී කේවල හා සමානුපාතික නියෝජනයේ අනුපාතය 70% ක් හා 30% ක් වශයෙන් වන පරිදි, එම මැතිවරණ ක්‍රමය සකස් කරන මෙන්, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

ඊට අනුකූලව, ගරු සභාපතිතුමා විසින් 2018.02.23 වන දින විවාදය අවසානයේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාව වෙනුවෙන් ඉල්ලා සිටින ලද බෙදීම යළිත් සභාභිමුඛ කරමින්, රීති අංක 107 යටතේ ඉදිරිපත් වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය විමසීම සඳහා සීනුව නාද කරන ලදී.

*අනතුරුව, **ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 37 යි, විරුද්ධව 20 යි, වැළකුණු 03 යි යනුවෙන් බෙදුණේය.***

***පූ.භා. 10.44 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 03. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙසන් කළ යුතු යැයි මෙරට වාමාංශික දේශපාලන පක්ෂ මෙන්ම දක්ෂිණාංශික දේශපාලන පක්ෂද, දැඩිව කථිකා කරන ලද අතර, විධායක ජනාධිපති ධූරය වහා අහෝසි කළ යුතු බවට බරපතළ උද්ඝෝෂණ පවා රට තුළ ක්‍රියාත්මක විය. මේ තත්ත්වය යටතේ රටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැදීමටත්, ජනාධිපති ධූරය සතු වූ අසීමාන්තික විධායක බලය, පාර්ලිමේන්තුවට පැවරීමටත්, පසු ගිය මැතිවරණ වලදී පොරොන්දු දෙනු ලැබීය. විධායක බලය අහෝසි කරන බවට පොරොන්දු වූ හිටපු ජනපතිවරුන් කිසිවෙක් එය එසේ ඉටු නොකළද, වර්තමාන*

*ජනාධිපතිතුමා දිගින් දිගටම බලයේ රැඳී සිටීමට හැකි වන ලෙස පනවා තිබූ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම, යම් සාධනීය ලක්ෂණයකි. වර්තමාන ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ද ජනතාව හමුවේ පෙරොන්දු වූ පරිදි සියලු පක්ෂ ඒකරාශි කරගෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට හරවත් සංවාදයක් ඇති කරන මේ මොහොතේ පටු දේශපාලන ආකල්ප ඉවත ලා මෙරටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීමට සියලුම ජනතාව ඒකරාශී කරගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි."*

## 04. කල් තැබීමේ යෝජනාව :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.28 ට, 2018 මාර්තු මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.03.06
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/06

*“බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ සංකල්පයක් පරිදි මුද්‍රණය කරන ලද මෙම පළාත් සභාවට අදාළ 1988 සිට 1995 දක්වා පළාත් සභා පුඥප්ති - වෙළුම I නම් ග්‍රන්ථයේ පිටපත් එතුමන්ගේ උපදෙස් පරිදි පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ පරිහරණය පිණිස බෙදාදීම පිණිස යොමු කරන බව ආණ්ඩුකාර ලේකම්තුමා විසින් සභා ලේකම්තුම වෙත අංක GOS/ADM/09 හා 2018.01.18 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බවත්, එම ග්‍රන්ථයේ පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන් වෙත සභා කාර්ය මණ්ඩලය මගින් ලබා දීමට කටයුතු සලස්වා තිබෙන බවත්, මෙවන් උත්කෘෂ්ඨ කාර්යයක් ඉටු කරලීම සඳහා පුරෝගාමී වීම පිළිබඳව එමෙන්ම ගරු ආණ්ඩුකාරතුමාණන්ට විශේෂ ස්තූතියක්, ප්‍රශංසාවක් පළ කර සිටින බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.”*